# 1.32 'ඛ්‍යාල්' හින්දී ජන නාටකය : ආරම්භයේ සිට අද්‍යතන යුගය දක්වා විමර්ශනාත්මක අධ්‍යයනයක්

උපුල් රංජිත් හේවාවිතානගමගේ
හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

---

## ABSTRACT

හින්දී භාෂක කලාපයෙහි ප්‍රචලිත විවිධ ජන නාටක සම්ප්‍රදායන් අතුරින් වර්ග 6ක් හින්දී කලාපය නියෝජනය කරන ජන නාටක ලෙස හඳුනාගත හැකිවෙයි. එනම්, රාම්ලීලා, රාස්ලීලා, නෞටංකී, ඛ්‍යාල්, මාච් සහ බිදේසියා යනුවෙනි. මෙම ලිපියේ අරමුණ වන්නේ උත්තර භාරතයේ හින්දී භාෂක කලාපයේ විශේෂයෙන් රාජස්ථාන් ප්‍රදේශය නියෝජනය කරන්නා වූ 'ඛ්‍යාල්' නමැති ජන නාටක සම්ප්‍රදායේ උද්භවයේ සිට අද්‍යතන යුගය දක්වා වූ විකාසනය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම ය.

මෙහි දී අපගේ විශේෂ අවධානයට ලක් වී ඇති ක්ෂේත්‍ර වන්නේ ඛ්‍යාල් නාටකයේ උද්භවය සහ විකාශනය, නාමකරණය, ශෛලීන්, ශෛලීන්හි විවිධතා, ව්‍යුහය, වස්තුවිෂය හා කථා, කථාවන්හි විවිධතා සහ විශේෂතා, වේදිකාව, වේදිකා සැරසිලි, ජවනිකා මාරු කිරීම, ආලෝකකරණය, ඇඳුම්-පැළඳුම්, වේශ නිරූපණය, භාෂාව හා සංවාද, පාත්‍රවර්ගයා සහ අභිනය, සංගීතය සහ නෘත්‍ය, අධ්‍යක්ෂණය සහ පුහුණුව, ප්‍රේක්ෂකයෝ, ප්‍රචාරක කටයුතු ආදිය යි.

ඛ්‍යාල් ජන නාටකයේ උද්භවය සහ විකාශනය සම්බන්ධයෙන් පර්යේෂණවල යෙදුණු විද්වතුන්ගේ මතිමතාන්තර තුලනාත්මක ව විමසා බලමින් වඩාත් යුක්තියුක්ත එකඟතාවකට පැමිණීම අපගේ අභිලාෂය වී ඇත්තේ ය. නාමකරණය හා සම්බන්ධ විවිධ අදහස් මෙහි දී සැලකිල්ලට භාජනය වන අතර, මෙම නාටකය විවිධ ශෛලීන් වශයෙන් ව්‍යාප්ත වී යෑම පිළිබඳ ව මෙන් ම ඒ හා බැඳුණු විවිධ හේතූන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ද මෙහි දී සිදු වෙයි. නාටකයේ ව්‍යුහය විමසීමෙහිලා ආරම්භයේ සිට අවසානය දක්වා අදාළ සියලු තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කෙරෙයි. වස්තුවිෂය සහ කථා මෙන් ම කථාවන්හි දක්නට ලැබෙන විවිධතා සහ විශේෂතා පිළිබඳ ව ද විස්තරාත්මක විශ්ලේෂණයක් මෙහි දී ඉදිරිපත් වන්නේ ය. පාත්‍රයන් හා අභිනය පිළිබඳ ඛ්‍යාල් නාටකයට ආවේණික රීතීන් කෙරෙහි මෙන් ම, හින්දී භාෂක කලාපයේ ජන රංග රීතීන්හි ඇති ස්වතන්ත්‍රතාව කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කෙරෙන්නේ ය. සංගීතය හා නෘත්‍ය යොදා ගැනීම සම්බන්ධයෙන් ඛ්‍යාල් නාටකයෙහි දක්නට ලැබෙන විශේෂතා සාකච්ඡාවට භාජනය වෙයි. පුහුණු කිරීම සහ මෙහයවීම සම්බන්ධයෙන් මෙන් ම, ප්‍රේක්ෂක සහභාගිත්වය සහ ප්‍රචාරක කටයුතු ගැන ද මෙහි දී සාකච්ඡා කෙරේ.

ඛ්‍යාල් ජන නාටකයේ උද්භවයේ සිට අද්‍යතන යුගය දක්වා විකාශනය වූ ආකාරය හා සම්බන්ධ ප්‍රාමාණික තොරතුරු මෙන් ම, ඒවා පිළිබඳ පූර්ණ වශයෙන් තත්ත්ව විභාගයක යෙදීම මගින් රාජස්ථාන් ප්‍රදේශයට අනන්‍ය වූ විශේෂතා රාශියකින් හෙබි හින්දී ජන නාටක ශෛලියක් හඳුනාගැනීමට ලැබෙයි. එමෙන්ම පෙරදිග ජන රංග රීතිය පිළිබඳව හදාරන පර්යේෂකයන්ට මෙයින් ප්‍රාමාණික අත්වැලක් සැපයෙන බව ද මෙහිලා අවශ්‍යයෙන් ම සඳහන් කළ යුත්තේ ය.